# සංක්‍රමණ නොවන වීසා

තාවකාලික කාල පරිච්ඡේදයක් සඳහා එක්සත් ජනපදයට ඇතුළු වීමට බලාපොරොත්තු වන අයට වීසා සේවා ලබා දීම කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ කොන්සියුලර් අංශයේ වගකීම වේ. සංචාරකයෙකුට අවශ්‍ය වන සංක්‍රමණ නොවන වීසා වර්ගය හා එම වීසාව ඉල්ලුම් කිරීමට තිබිය යුතු අවශ්‍යතා බොහෝ විට රැඳී පවතින්නේ එක්සත් ජනපදයට සංචාරය කිරීමේ අරමුණ මතයි.

සංක්‍රමණ නොවන වීසා වර්ග නාමාවලිය (directory of nonimmigrant visa categories) ඇතුළු සංක්‍රමණ නොවන එක්සත් ජනපද වීසා (nonimmigrant U.S. visa) සඳහා අයැදුම් කිරීම පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමට අපේ ගෝලීය සහාය සේවා (GSS) වෙබ් අඩවියට පිවිසෙන්න.

**සම්මුඛ පරීක්ෂණය අතහැර පෙට්ටියට දැමීමේ වැඩසටහන**

එක්සත් ජනපදයට නැවත නැවතත් එන සංචාරකයන් සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී නො සිට තම වීසාව අලුත් කර ගැනීමට හැකි වේ. සම්මුඛ පරීක්ෂණය අත්හැරීමේ වැඩසටහන යටතේ අවශ්‍ය සුදුසුකම් ඔබ සපුරා ඇත්නම් නියමිත කාල තුළ ඔබේ වීසා අයදුම්පත තානාපති කාර්යාලයේ ඒ සඳහා තබා ඇති පෙට්ටියකට ඒ සඳහා වෙන් කර ඇති කාලය තුළ දැමීමට පුළුවන. නැවත වීසාවක් ලැබීමට ඔබ සුදුසු නම් දින කීපයක් තුළ අලුත් වීසාවත්, ගමන් බලපත්‍රයත් ලබා ගත හැකි වේ.

මේ සඳහා තිබිය යුතු සුදුසුකම් ගැන දැන ගැනීමට අපේ 'සම්මුඛ පරීක්ෂණය අතහැර පෙට්ටියට දැමීමේ වැඩසටහන් පිටුව' (Interview Waiver Drop Box Program page) වෙත යන්න. [http;//www.ustraveldocs.com/lk/lk-niv-visarenew.asp]

**එක්සත් ජනපද තානාපති කාර්යාලයට පැමිණීමේ දි අපේක්ෂා කළ යුත්තේ මොනවා ද ?**

වීසා අයදුම්කරුවන්ට පහසු අයැදුම් ක්‍රියාවලියක් සැපයීම, සංක්‍රමණ නොවන වීසා ඒකකයේ අරමුණ වේ. මෙම ප්‍රයත්නයේ එක කොටසක් වන්නේ ඔවුන්ගේ සම්මුඛ පරීක්ෂණයට මිනිත්තු 15කට පමණක් පෙර එක්සත් ජනපද තානාපති කාර්යාලයේ දොරටුව වෙත පැමිණෙන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටීමයි. මෙම නීතිය අකුරට පිළිපැදීමෙන් තානාපති කාර්යාලයෙන් පිටත දීර්ඝ කාලයක් අනවශ්‍ය ලෙස රැඳී සිටීම වැළකේ. සම්මුඛ පරීක්ෂණයට පැය ගණනකට කලින් පැමිණීමෙන් අයදුම්කරුවෙකුට විශේෂ වාසියක් අත් නොවේ.

**තානාපති කාර්යාල පරිශ්‍රය තුළට ගෙන ඒමට අවසර නැති ඉලෙක්ට්‍රොනික උපකරණ:**

සියලු අයදුම්කරුවන්ගේ හා සේවකයන්ගේ ආරක්ෂාවත්, සුරක්ෂිත බවත්, සහතික කිරීම සඳහා වීසා අයදුම්කරුවන්ට තානාපති කාර්යාලය තුළට පහත සඳහන් දේ ගෙන ඒමට **අවසර නැත**

- බැටරි මගින් ක්‍රියා කරන ඕනෑම ආකාරයක ඉලෙක්ට්‍රොනික උපකරණ (ජංගම දුරකථන, ඩිජිටල් කැමරා, ලැප්ටොප් පරිගණක, සංගීතය සපයන උපකරණ, PSP වැනි ක්‍රීඩා කොන්සෝල, USB ධාවක, ජංගම ටැබ්ලට් උපකරණ ආදිය)
- ලයිටර් හා දැල්ලක් ජනනය වන ඕනෑම උපකරණයක්
- මුවහත් උපකරණ
- (On/off) ස්විච්චයක් සහිත ඕනෑම උපකරණයක්

මෙවැනි උපකරණ ගෙන එන අයදුම්කරුවන්ට ඇතුළු වීමට අවසර නොමැති අතර අලුතෙන් සම්මුඛ පරීක්ෂණ දිනයක් ලබා ගන්නා ලෙස දැනුම් දෙනු ඇත.

ඔබේ සම්මුඛ පරීක්ෂණයට පැමිණීමට පෙර තානාපති කාර්යාලයෙන් පිටස්තර සුරක්ෂිත ස්ථානයක ඔබේ ඉලෙක්ට්‍රොනික උපකරණ තැබීමට පිළියෙල කර ගන්න. මේ නිසා ඔබට ඇති වන අපහසුව ගැන අපි කනගාටු වන අතර ඔබෙන් ලැබෙන සහයෝගය අගය කරමු.

## රාජ්‍ය තාන්ත්‍රික/නිල වීසා (A, G, සහ C-3)

විදේශීය රජයක හෝ ජාත්‍යන්තර සංවිධානයක හෝ දූත මණ්ඩලයක නිල කටයුත්තක් සඳහා ඔබ එක්සත් ජනපදයට යන්නේ නම් ඔබට රාජ්‍ය තාන්ත්‍රික හෝ නිල වීසාවක් ( A, G හෝ C-3) සඳහා අයැදුම් කළ හැක.

**සැකසුම් කාලය:** සම්පූර්ණ කරන ලද වීසා අයදුම්පත හා අවශ්‍ය ලේඛන සියල්ල තානාපති කාර්යාලයට භාර දීමෙන් පසු සාමාන්‍ය A හා G වීසාවක් නිකුත් කිරීමට *අවම වශයෙන් වැඩ කරන දින තුනක්* අවශ්‍ය වේ.

විමසීම් : රාජ්‍ය තාන්ත්‍රික වීසා පිළිබඳ ගැටලු හෝ තොරතුරු ලබා ගැනීමට සංක්‍රමණ නොවන වීසා අංශය අමතන්න. ConsularColombo@state.gov

### A වීසා

එක්සත් ජනපදයට යෑමේ අරමුණ කුමක් වුවත් A-1 වීසා සඳහා සුදුසුකම් ලබන රාජ්‍ය නායකයෙකුට හැර වෙනත් රාජ්‍ය තාන්ත්‍රිකයන් හා රජයේ නිලධාරීන්ට අවශ්‍ය වීසා වර්ගය ඔවුන් එක්සත් ජනපදයට ඇතුළු වන හේතුව මත රැඳී පවතී.

A-1 හා A-2 වීසා සඳහා සුදුසුකම් ලැබීමට එම පුද්ගලයා එක්සත් ජනපදයට සංචාරය කරනු ලබන්නේ ඔහුගේ හෝ ඇගේ ජාතික ආණ්ඩුව වෙනුවෙන් එම රජයේ නිල කටයුතුවල යෙදීම සඳහා පමණක් විය යුතුය. ඔවුන්ගේ පළාත, කොට්ඨාසය හෝ වෙනත් දේශපාලන ආයතනයක් නියෝජනය කරන ප්‍රාදේශීය රජයේ නිලධාරීන් A වීසා සඳහා සුදුසුකම් නොලබයි. ඔවුන්ට අවශ්‍ය වන්නේ B-1 හෝ B-2 වීසායි. A- වීසා සඳහා වීසා අයැදුම් ගාස්තුවක් නැත.

**සටහන:** වාණිජ ස්වභාවයක රාජ්‍ය නොවන කටයුතු හෝ සංචාරකයන් ලෙස හෝ එක්සත් ජනපදයට යන රජයේ නිලධාරීන්ට අදාළ සංක්‍රමණ නොවන වීසා අවශ්‍ය වේ. වැඩිදුර තොරතුරු සඳහා ව්‍යාපාරික/සංචාරක වීසා පිළිබඳ කොටස බලන්න. සාමාන්‍යයෙන් B1/B2 වීසා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා පුද්ගලිකව පෙනී සිටීම අවශ්‍ය වේ. රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර මත සංචාරය කරන B-1/B-2 වීසා අයදුම්කරුවන් සඳහා වීසා අයැදුම් ගාස්තුවක් නැත.

### G වීසා

G වීසාවක් සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්කරු එක්සත් ජනපදයට ඇතුල් විය යුත්තේ නිල රාජකාරි සඳහා ය. පිළිගත් ආණ්ඩුවකින් ජාත්‍යන්තර සංවිධානයකට යවන ස්ථිර දූත මණ්ඩලයක සාමාජිකයන් G-1 වීසා සඳහා සුදුසුකම් ලබයි. නම් කළ ජාත්‍යන්තර සංවිධානයක රැස්වීම්වලට සහභාගී වීමට තාවකාලිකව එක්සත් ජනපදයට යන පිළිගත් ආණ්ඩුවක නියෝජිතයන් G-2 වීසා සඳහා සුදුසුකම් ලබයි. පිළි නො ගත් හෝ සාමාජික නොවන ආණ්ඩුවල නියෝජිතයන් G-3 වීසා සඳහා සුදුසුකම් ලබයි. G-4 වීසා නිකුත් කරනු ලබන්නේ එක්සත් ජාතීන් ඇතුළු නම් කරන ලද

ජාත්‍යන්තර සංවිධානවල පත්වීමක් සඳහා එක්සත් ජනපදයට යන පුද්ගලයන්ටයි. මෙම වීසා වර්ගයට ද වීසා අයැදුම් ගාස්තු අය නො කෙරේ.

### C-3 වීසා

එක්සත් ජනපදය තුළින් වෙනත් රටකට යෑම සඳහා පමණක් ඇතුළු වන විදේශීය රාජ්‍ය නිලධාරීන් ඔවුන්ගේ පවුල් සාමාජිකයන් හා ඔහුගේ හෝ ඇයගේ සේවකයන් හෝ පුද්ගලික සහකරුවන් සඳහා අදාළ වන්නේ C-3 වීසාවයි.

### රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ ආසන්න පවුල් සාමාජිකයන් සඳහා වීසා

A-1, A-2, G-1, G-2, G-3 සහ G-4 වීසා හිමි අයගේ ආසන්න පවුල් සාමාජිකයන්, මූලික වීසා හිමියා සමග හෝ 'පසුව එක්වීමට" හෝ යන්නේ නම් ඔවුන්ට ද ව්‍යුත්පන්න තත්වය යටතේ එම වර්ගයේ ම වීසා ලබා ගැනීමට හිමිකම් තිබේ. ආසන්න පවුල් සාමාජිකයා යනු කලත්‍රයා හා නිවසේ සාමාජිකයන් වන ඕනෑම වයසක විවාහ නොවූ පුතුන් හා දියණියන් ය. ඔබේ නිවසේ ජීවත් වන, වෙනත් නිවසක සාමාජිකයෙක් නොවන, රාජ්‍යතාන්ත්‍රික හෝ නිල ගමන් බලපත්‍ර හෝ සංචාරක හා අනිකුත් දීමනා වැනි දේ ලබා දීමෙන් අයිතිවාසිකම් හා ප්‍රතිලාභවලට සුදුසුකම් ඇති බව පෙන්වා දීමෙන් ඔබේ රජයෙන් හෝ ඔබ පත් කරන ජාත්‍යන්තර සංවිධානයෙන් ආසන්න පවුල් සාමාජිකයෙක් ලෙස පිළිගන්නා පුද්ගලයෙක් ද ආසන්න පවුල් සාමාජිකයෙක් ලෙස සැලකිය හැකියි. නිවසේ සාමාජිකයන් පිළිබඳ වැඩි විස්තර සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න. http://travel.state.gov/content/visas/english/other/diplomat-foreign-government-official.html

ඉහත විස්තර කර ඇති ආකාරයට ආසන්න පවුල් සාමාජිකයෙක් ලෙස සුදුසුකම් නො ලබන පවුල් සාමාජිකයෙක් සංචාරක (B-2) වීසාවකට සුදුසුකම් ලැබිය හැකි වේ. සංචාරක වීසා අයදුම්කරුවන් වීසා සම්මුඛ පරීක්ෂණයක් සඳහා පැමිණිය යුතු අතර අදාළ නම් වීසා අයැදුම් කිරීමේ හා වීසා නිකුත් කිරීමේ ගාස්තු ගෙවිය යුතු වේ.

### මූලික අයදුම්කරුවන් සඳහා වූ අතිරේක ලේඛන අවශ්‍යතා

1. රාජ්‍යතාන්ත්‍රික සටහන

   රාජ්‍ය තාන්ත්‍රික සටහන යනු ඔබේ තත්වය හා එක්සත් ජනපදයට යෑමේ නිල කාර්යය පිළිබඳ ලිඛිත තහවුරු කිරීමකි. A හා C-3 වීසා සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් රාජ්‍ය තාන්ත්‍රික සටහන නිකුත් කරනු ලබන්නේ එම රටේ විදේශ කටයුතු අමාත්‍යංශය විසිනි. G- වීසා සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් රාජ්‍ය තාන්ත්‍රික සටහන නිකුත් කරනු ලබන්නේ අයදුම්කරු පත් කරන ජාත්‍යන්තර සංවිධානය විසිනි.

   රාජ්‍යතාන්ත්‍රික සටහනේ අඩංගු විය යුතු කරුණු.

- නම හා උපන් දිනය
- තත්වය හා නිලය
- යා යුතු හෝ වැඩ කළ යුතු ස්ථානය
- සංචාරයේ අරමුණ
- රාජකාරී පිළිබඳ කෙටි විස්තරයක්
- සංචාරය කරන දින
- එක්සත් ජනපදයේ සිටීමට අපේක්ෂිත කාලය හා

- අදාළ නම් මූලික වීසා අයදුම්කරු සමග යන හෝ පසුව ඔහුට එක් වන යැපෙන්නන් හා නිවසේ අනිත් සාමාජිකයන් වේ නම් ඔවුන්ගේ නම, නෑකම හා උපන් දින.

  සටහන: දින 90කට වැඩි සංචාරයක් සම්බන්ධයෙන් රාජ්‍යතාන්ත්‍රික සටහන එවිය යුත්තේ අයැදුම්කරුගේ රටේ විදේශ කටයුතු කාර්යාලයෙන් මිස එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් හෝ දූත මණ්ඩලයෙන් නොවේ.

2. අදාළ නම් අයදුම්කරු යවන රජයෙන් හෝ සංවිධානයෙන් ලැබුණු සංචාර අනුමැතිය/චාරිකා සටහන/නියෝග ආදිය

**ආසන්න පවුල් සාමාජිකයන් සඳහා වූ අතිරේක ලේඛන අවශ්‍යතා**

- ප්‍රධාන අයදුම්කරුගේ තත්වය පිළිබඳ සාක්ෂි - රාජ්‍යතාන්ත්‍රික සටහන හෝ ප්‍රධාන අයදුම්කරු ගේ වර්තමාන සේවායෝජකයාගෙන් ලිපියක්
- ප්‍රධාන අයදුම්කරුගේ සංක්‍රමණ නොවන A හෝ G වීසාවේ පිටපතක්

සම්මුඛ පරීක්ෂණය ඉක්මන් කිරීමේ ඉල්ලීම්

වීසා සම්මුඛ පරීක්ෂණ සඳහා ඇති අධික ඉල්ලුම නිසා ඒවා ඉක්මන් කිරීමට කරන ඉල්ලීම් සියල්ලට ම ඉඩ දිය හැකි නොවේ. කෙසේ වෙතත් හදිසි වෛද්‍ය ප්‍රතිකාර, පවුල් සාමාජිකයෙකුගේ මරණය, (සීමිත අවස්ථාවන්හි) ව්‍යාපාරික හේතු හෝ දැඩි කාල සීමා ඇති ශිෂ්‍යයන්ට ඉක්මන් සම්මුඛ පරීක්ෂණ ලබා දීමට හැකි සෑම උත්සාහයක් ම දරන්නෙමු.

ඉක්මන් සම්මුඛ පරීක්ෂණයක් ඉල්ලීම සඳහා අපේ වෙබ් අඩවියේ ඇති ඉක්මන් සම්මුඛ පරීක්ෂණ කොටසේ (Expedited Appointment section) ඇති පියවර අනුගමනය කරන්න. ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයන්ට ඉක්මන් දිනයක් ලබා දිය නො හැකි නමුත් සබැඳි ක්‍රියාවලිය තුළින් අයදුම්කරුවන්ට මග පෙන්වීමට උපකාර කළ හැකි වේ.

තානාපති කාර්යාලයේ ඇමතුම් මධ්‍යස්ථානයට (Embassy call center) හා සබැඳි දින වෙන් කිරීමේ වෙබ් අඩවියට (online appointment website) වීසා අයැදුම් ක්‍රියා පිළිවෙළ ගැන තොරතුරු ලබා දීමටත්, සම්මුඛ පරීක්ෂණ සඳහා දිනයක් ඉල්ලීමට සම්බන්ධ තාක්ෂණික සහාය සැපයීමටත් හැකි වේ.

**අප අමතන්න**

අපේ සේවා සපයන්නා හා සම්බන්ධ වීමේ විවිධ ක්‍රම පිළිබඳ සම්පූර්ණ තොරතුරු සඳහා කරුණාකර GSS Contact Us පිටුවට පිවිසෙන්න.

http://www.ustraveldocs.com/lk/lk-main-contactus.asp

**අතිරේක සම්පත්**

- සංක්‍රමණ නොවන වීසා ගැන නිති අසන පැන
- එක්සත් ජනපදයේ සංචාරය හා සංචාරක කර්මාන්තය
- නෛතික අයිතිවාසිකම් හා ආරක්ෂාව
- වංචා වැළැක්වීමේ අනතුරු ඇඟවීම
- සූචිය (A to Z)

**අප අමතන්න**

ශ්‍රී ලංකාවේ වේලාවෙන් පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වාත්, එක්සත් ජනපදයේ නැගෙනහිර සම්මත වේලාවෙන් පෙ.ව. 8.00 සිට ප.ව. 8.00 දක්වාත් පාරිභෝගික සේවා නියෝජිතයන් ඔබට ආධාර කිරීමට සූදානම් ව සිටී. ඇමතුම් මධ්‍යස්ථානය සති අන්තවල හා දේශීය ජාතික නිවාඩු දිනවල ක්‍රියාත්මක නොවේ.

ශ්‍රී ලංකාවෙන් ඇමතීමට: 94-11-770-3703

එක්සත් ජනපදයෙන් ඇමතීමට: 1-703-988-3469

එසේ නැත්නම් ඔබට support-srilanka@ustraveldocs.com යන ලිපිනයට ඉ-තැපැල් පණිවුඩයක් යැවිය හැක.

**රාජ්‍ය ආයතන සබැඳතා**

- එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවා (U.S. Citizenship and Immigration Services)
- එක්සත් ජනපද රේගු හා දේශ සීමා ආරක්ෂාව (U.S. Customs and Border Protection)
- ඇමරිකා එක්සත් ජනපද රජය (USA.gov)
- එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව (U.S. Department of State)